# ප්‍රත්‍යක්‍ෂ හා මූල හේතු

බුදුන් වහන්සේ ප්‍රත්‍යක්‍ෂ ගැන මිස වියුක්ත ප්‍රවාද ගැන එතරම් කතා නොකරන්නට ඇත්තේ ප්‍රත්‍යක්‍ෂ නිවැරදි නිසා හා ප්‍රවාද නිවැරදි නොවන නිසා විය නොහැකි ය. ප්‍රවාද මෙන් ම ප්‍රත්‍යක්‍ෂ ද අවසාන වශයෙන් ගත්කල මනසේ නිර්මාණ වෙයි. මනසේ නිර්මාණ ලෙස ගත්කල ඒ දෙකින් එකක්වත් ඊනියා යථාර්ථය බවට පත්නොවේ. එසේ නම් බුදුන් වහන්සේ එකක් මගහැර අනෙක දැනුම ලෙස ගැනීමට දේශනා කරන්නට ඇත්තේ ඇයි ද යන ප්‍රශ්නයට පිළිතුරක් සැපයීමට සිදු වෙයි. එයට ආංශික පිළිතුරක් කලින් දී ඇත. මෙහි දී එය තවත් වර්ධනය වෙයි. ප්‍රත්‍යක්‍ෂ ද අවසාන වශයෙන් ගත්කල මනසේ නිර්මාණ වුව ද, ඒ ඉන්ද්‍රිය ගෝචර වෙයි. එහෙත් වියුක්ත ප්‍රවාද ඉන්ද්‍රිය ගෝචර නොවෙයි. ගුරුත්වාකර්ෂණ ක්‍ෂෙත්‍රය දුටු අයකු හෝ ස්පර්ශ කළ අයකු හෝ නැත. එහෙත් බොහෝ දෙනා සිතන්නේ ගුරුත්වාකර්ෂණය මිනිසාගෙන් තොරව පවතින බව ය. ගුරුත්වාකර්ෂණය ද යනු යම්කිසි පුද්ගලයකුගේ, මෙහි දී නිව්ටන් පඬිවරයාගේ, නිර්මාණයක් වෙයි.

බටහිර රටවල ප්‍රපංචවේදය (phenomenolgy) නමින් දර්ශනයක් වෙයි, අද ඊනියා පශ්චාත්නූතනවාදීන් අතර මේ දර්ශනය බෙහෙවින් ජනප්‍රිය වී ඇත. මේ සම්බන්ධයෙන් කිවයුතු වැදගත් ම කරුණක් වන්නේ ප්‍රපංචවේදීන් ප්‍රපංචය ප්‍රධානකොට සලකන බව ය. ප්‍රපංචය, එලෙස ම, එනම් ප්‍රපංචය ලෙස ම ගැනීම විවිධාකාර ප්‍රපංචවේදීන්ගේ ප්‍රයත්නය වෙයි. ප්‍රපංචවේදීහු අනුභූතිවාදය (empiricism) විවේචනය කරති. ඔවුන්ට අනුව ආනුභූතිකවාදීහු ප්‍රපංචය, ප්‍රපංචය ලෙස නොගෙන එයට අර්ථකථන දෙති. අර්ථකථන දෙන්නේ මනසින් බව තේරුම්ගත් පසු මෙයින් අදහස් වන්නේ මනසින් තොරව ඇති ප්‍රපංච ගැන කතාකිරීම බව පැහැදිලි වනු ඇත. මනසින් තොරව ප්‍රපංච පවතින්නේ යැයි ගැනීම කැමරාවකට ප්‍රපංච ඇතැයි ගැනීම වැනි වුවකි. කැමරාව හා ප්‍රපංචවේදීන් අතර ඇති වෙනස නම් කැමරාව එලෙස ප්‍රපංච ඇතැයි නොසිතීම ය. කැමරාවට සිතීමට නොහැකිවීම කෙතරම් භාග්‍යයක් ද?

මෙරට සිටින ඇතැම් ඔල්කට් බෞද්ධයෝ බුදුන්වහන්සේ දෙසූ දහම අනුභූතිවාදයක් හෝ ඇතැම්විට ප්‍රපංචවේදයක් හෝ ලෙස සලකති. අනුභූතිවාදය හා ප්‍රපංචවේදය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි බිහි වූ දර්ශන වෙයි. මේ දර්ශන බිහිවන්නේ ම මුල් හේතුවක් ඇතැයි යන පදනමේ සිට ය. මුලින් ම ඇත්තේ අනුභූතිය ද, නැත්නම් ප්‍රපංචය ද යන්න මෙහි දී ප්‍රශ්නයක් වෙයි. ආනුභූතිකවාදීන්ට අනුව අනුභූතිය ප්‍රධන වෙයි. එහෙත් ප්‍රපංචවේදීන් කියා සිටින්නේ ආනුභූතිකවාදීන්ගේ අනුභූතියට අනුව ප්‍රපංච ප්‍රපංච ලෙස නොගෙනී ප්‍රපංචවලට අර්ථකථන සැපයෙන බව ය.

බුදුන්වහන්සේ අනුභූතිවාදියකුවත් ප්‍රපංචවාදියකුවත් නොවූහ. උන්වහන්සේට මූල හේතුවක් නොතිබුණි. උන්වහන්සේ දෙසූයේ මනස නමින් ගන්නා දේ ද ව්‍යාජබවත්, මේ ව්‍යාජ මනස අව්‍යාජ ලෙස ගැනී ම කාලය වැනි සංකල්ප එලෙස ඇතැයි ගැනීමට සමන බවත් ය. බුදුනවහන්සේට අනුව ප්‍රපංච යනුවෙන් සංකල්පයක් තිබුණ ද ප්‍රත්‍යක්‍ෂ යන සංකල්පය වඩා ව්‍යවහාරයට ගැණිනි. ප්‍රත්‍යක්‍ෂ යන්නෙහි අත්විඳින බවක් ඇත. අත්විඳින්නේ මනස ආධාරයෙනි. මනසක් නැතිව අත්විඳිය හැක්කක් නැත. ඒ අරුතින් ද මනස ප්‍රධාන වෙයි.

දැන් ප්‍රශ්නය වනුයේ ප්‍රත්‍යක්‍ෂය යන්න මූල හේතුවක් ද යන්න ය. එනම් බටහිර ආනුභූතිකවාදීන් හා ප්‍රපංචවාදීන් පිළිවෙළින් අනුභූතිය හා ප්‍රපංචය මූල හේතුව ලෙස ගන්නා ආකාරයෙන් ප්‍රත්‍යක්‍ෂය මූල හේතුවක් ද යන්න ය. එයට පැහැදිලි පිළිතුර එය එසේ නොවේය යන්න ය. ප්‍රත්‍යක්‍ෂය ඇතිවීමට නාම රූප අවශ්‍ය වෙයි. එහෙත් නාම රූප මූල හේතුවක් නොවේ. නාම රූප හටගන්නේ විඥානය හේතුවෙනි. විඥානයට සංකාරය අවශ්‍ය වෙයි. ඇතැම් තැනක නාම රූප පච්චයා විඥාන, විඥාන පච්චයා නාම රූප යනුවෙන් ඒ එක එකක් අනෙක නිසා හටගන්නා බව දැක්වෙයි. සංකාර හටගන්නේ අවිද්‍යාව නිසා ය. එහෙත් අවිද්‍යාව ද මූල හේතුවක් නොවේ.

මේ සියල්ල පැහැදිලි කෙරෙන තැන පටිච්ච සමුප්පාදය වෙයි. පටිච්ච සමුප්පාදයෙන් විස්තර වන්නේ මනස පිළිබඳ කතාවකි. මා දකින අයුරින් නම් පටිච්ච සමුප්පදයෙහි කියැවෙන්නේ නැති මනස ඇති මනසක් බවට පත්කර ගැනෙන්නේ කෙසේ ද යන්න ය. මුළු පටිච්ච සමුප්පාදයම චක්‍රීය චින්තනය මත පදනම් වෙයි. එහි එක එකක් අනෙකක් ඇති විට ඇති බවත් නැති විට නැති බවත් කියැවෙයි. එහි මූල හේතුවක් නොවේ. පටිච්ච සමුප්පදාය

© Prof. Nalin De Silva

සාම්ප්‍රදායික ව අවිද්‍යාවෙන් පටන්ගත්ත ද, වෙනත් ඕනෑම තැනකින් ද පටන්ගත හැකි ය. අවිද්‍යාව යනු අනිත්‍ය, දුක්ඛ, අනාත්ම අනාවබෝධය ය. ඒ අනාවබෝධ වන්නේ මනසක් ඇතැයි ගන්නා බැවිනි. මනසක් ඇතැයි ගන්නේ ද මනස ම ය. මෙය පටලැවිල්ලක් ලෙස සිතෙන්නේ මූල හේතුවක් ඇතිව සිතීමට අප පුරුදු කෙරී ඇති බැවිනි. මූල හේතු නැතිව සිතන්නට පටන් ගත්කල මෙහි කිසිම පටලැවිල්ලක් නොවේ.

ප්‍රත්‍යක්ෂය ඇතිවන්නේ මනස නිසා ය. මනසක් නැත්නම් ප්‍රත්‍යක්ෂයක් නැත. කැමරාවට ප්‍රත්‍යක්ෂයක් නැත්තේ එබැවිනි. එහෙත් මනස ඇතිවන්නේ කිනම් දෙයක් හෝ කරුණක් හෝ නිසාදැයි විමසුවොත් එයට පිළිතුරක් ලෙස මනස ඇතිවන්නේ ප්‍රත්‍යක්ෂ එලෙස ප්‍රත්‍යක්ෂ කිරීම නිසා යැයි කිව හැකි ය. මූල හේතුවක් ඇතැයි පිළිගනිමින් මෙය හතර බීරි කතාවක් ලෙස සිතන්නන්ගෙන් ඇසිය යුත්තේ එකම එක ප්‍රශ්නයක් පමණකි. එනම් මූල හේතුවෙහි හේතුව කුමක් ද යන්න ය.  මූල හේතුව කිසිම හේතුවක් නැතිව ඇතිවීම තේරුම් ගන්නේ කෙසේ ද? ප්‍රපංචය මූල හේතුව ලෙස සලකා එතැනින් පටන් ගන්නා අයගෙන් ප්‍රපංචය ඇතිවන්නේ කෙසේ දැයි ඇසිය හැකි ය.

මූල හේතුව යෙහෝවා දෙවියන් වහන්සේ ගැන කතාකරන යුදෙව් චින්තනයේත් ස්වසිද්ධිවලින් (axioms) පටන් ගන්නා ග්‍රීක චින්තනයේත් මිශ්‍රණයෙන් ඇති වූ චින්තනයක් මත පදනම් වෙයි. අප දෙවියන් වහන්සේ මෙන් ම ස්වසිද්ධි ද  විශ්වාස කළ යුතු ය. ස්වසිද්ධිවලට ඇතැම් විට බටහිර ගණිතයෙහි ප්‍රත්‍යක්ෂ යන පදය ද භාවිතා වෙයි. එසේ වන්නේ පාරිභාෂික ශබ්දමාලාවෙහි, ඇක්සියම් (axiom) යන්නට ස්වසිද්ධිය හා ප්‍රත්‍යක්ෂය යන වචන දෙක ම සඳහන් වී ඇති බැවිනි. මේ ප්‍රත්‍යක්ෂය හා බුදුන් වහන්සේ දෙසන ප්‍රත්‍යක්ෂය යනු දෙකක් මිස එකක් නොවන බව අවධාරණය කළ යුතු ය. මේ පටලැවිල්ල නිසා ඇක්සියම් යන්නට ප්‍රත්‍යක්ෂය යන්නට වඩා ස්වසිද්ධිය යන්න උචිත යැයි සිතමි.

අප මේ ගැන සැලකිලිමත් විය යුත්තේ අපේ ප්‍රවාද ගොඩනැගීමේ දී අප හැකිතාක් නිරවුල් විය යුතු බැවිනි. අපේ සම්ප්‍රදාය කුමක් ද, අපේ චින්තනය කුමක් ද ආදිය ගැන නොදැන අපට අපේ ප්‍රවාද ගොඩනැගිය හැකි නොවේ. ප්‍රත්‍යක්ෂය යන වචනය අප තේරුම් ගත යුත්තේ එය අපේ සම්ප්‍රදායෙහි යෙදී ඇති ආකාරයට මිස පාරිභාෂික ශබ්දමාලා ඔස්සේ නොවේ.

අප සැලකිලිමත් විය යුත්තේ මනසක් නැතිව, මනසකින් පරිබාහිරව අනුභූතියටත් ඔබ්බෙන් ඇතැයි කියන ඊනියා ප්‍රපංච ගැන නොව, මනස ආධාරයෙන් කෙරෙන ප්‍රත්‍යක්ෂ ගැන ය; වේදනාවන් ගැන ය; සංඥා ගැන ය. අප තේරුම් ගතයුතු කරුණ නම් ප්‍රත්‍යක්ෂයක් සංකල්පයක් නොමැතිව ඇති නොවන බව ය. අපට මලක සුවඳ දැනෙන්නේ යැයි සිතමු. එය හුදෙක් මනසින් තොරව ඇතිවන්නක් නොවේ. මලෙහි සුවඳ ගැන අපට හැඟීමක් ඇත. ඒ හැඟීම වචනයෙන් කිව යුතු සංකල්පයක් යැයි මම නොකියමි. වචනයක් නැති වුව ද සුවඳ පිළිබඳ සංකල්පයක් අපේ මනසෙහි වෙයි. එසේ නොවන්නට නාසය ඔස්සේ යම් සුවඳකට අදාළ දේ කෙතරම් ගිය ද අපට කිසිවක කිසිම සුවඳක් නොදැනෙනු ඇත.

එහෙත් මේ එකක්වත් ඊනියා යථාර්ථයක් නොවේ. මනස ද ඇතුළු සියල්ල මනසෙහි නිර්මාණ වෙයි. එක් අතෙකින් ගත්කල මෙය ද අපේ ප්‍රවාදයක් වෙයි. ඒ ප්‍රවාදය ද ගොඩනැගී ඇත්තේ අපේ චින්තනය පදනම් කරගනිමිනි. සියල්ල නිර්මාණය කෙරි ඇත. සියල්ල සංස්කරණය කෙරී ඇත. සංස්කරණය කෙරුණු සියල්ල අනිත්‍ය වෙයි. මනස ද අනිත්‍ය වෙයි. එහෙත් අනිත්‍ය අපට අවබෝධ වී නැත. අනිත්‍ය අනාවබෝධය අවිද්‍යාව වෙයි. අවිද්‍යාව නිසා මනස ඇතිවෙයි. මෙහි ඇති චක්‍රීය චින්තනය පැහැදිලි විය යුතු ය. බුදුන් වහන්සේ ප්‍රත්‍යක්ෂයෙන් දැනගන්නා ලෙස කීව ද ප්‍රත්‍යක්ෂය ද අවිද්‍යාව නිසා සංස්කරණය කෙරී ඇත. එහෙත් කලින් සඳහන් කර ඇති ආකාරයට ප්‍රත්‍යක්ෂ ඉක්මවා අපට යා නොහැකි ය. ප්‍රත්‍යක්ෂ ද නිර්මාණ වුව ද බුදුන් වහන්සේ ප්‍රවාදවලට වඩා ප්‍රත්‍යක්ෂ ගැන අවධාරණය කෙළේ එබැවින් යැයි සිතමි.

අපට ප්‍රවාද නැතිව ජීවත්විය හැකි වුව ද ප්‍රත්‍යක්ෂ නැතිව ජීවත්විය හැකි නොවේ. පොල් ගෙඩි වැටෙන්නේ ය යන්න ප්‍රත්‍යක්ෂ කර නොගත්තේ නම් අප වැටෙන පොල් ගෙඩියකට හිස දී මිය යෑමට ද ඉඩ තිබේ. එය ජීවත්වීමට ප්‍රත්‍යක්ෂ අවශ්‍ය වේය යන්න පිළිබඳ එතරම් හොඳ උදාහරණයක් නොවේ. එහෙත් අපට ජීවත්වීමේ දී අවශ්‍ය වන බඩගින්න,

© Prof. Nalin De Silva

බඩගින්න නිවාගැනීම ආදිය ද ප්‍රත්‍යක්ෂ වෙයි. පොල් ගෙඩි වැටීම පිළිබඳ ප්‍රත්‍යක්ෂය අපට අවශ්‍ය වුව ද පොල් ගෙඩි වැටෙන්නේ ගුරුත්වාකර්ෂණය නිසා ය යන ප්‍රවාදය අපට අවශ්‍ය නොවේ. ගුරුත්වාකර්ෂණය යනු පංචේන්ද්‍රියට ගෝචර නොවන වියුක්ත ප්‍රවාදයකි. මේ ප්‍රවාදය බොහෝ අවස්ථාවල දී සඳහන් කර ඇති අන්දමට වියුක්ත නිර්මාණයක් පමණකි. ප්‍රත්‍යක්ෂවල ගුරුත්වාකර්ෂණයෙහි මෙන් වියුක්තබවක් නැත. එහෙත් ප්‍රත්‍යක්ෂ ද නිර්මාණය කෙරෙන දෑ පමණකි.

අපට ප්‍රත්‍යක්ෂ සම්බන්ධයෙන් තවත් බොහෝ දෑ සාකච්ඡා කිරීමට තිබුණ ද මේ ඒ සඳහා අවස්ථාව නොවේ. එහෙත් මෙහි දී එක් කරුණක් පිළිබඳ අපේ අවධානය යොමු නොකර සිටිය නොහැකි ය. ඒ අවිඥානය හා සවිඥානය පිළිබඳ ව ය. අප මෙතෙක් සාකච්ඡා කෙළේ සවිඥානික දෑ ගැන ය. පොල් ගෙඩිය, එය වැටීම, බඩගින්න, බඩගින්න නිවාගැනීම ආදිය සවිඥානික ප්‍රත්‍යක්ෂ වෙයි. ප්‍රත්‍යක්ෂයක් සවිඥානික විය යුතු ම ද? අවිඥානික ප්‍රත්‍යක්ෂ තිබිය හැකි ද? අපේ උඩු සිත, යටි සිත ආදිය ගැන අපට කිව හැක්කේ කුමක් ද? යටි සිතක් යනුවෙන් දෙයක් පවතින්නේ ද? අප දකින සිහින අපේ ප්‍රත්‍යක්ෂ ද? අපේ උඩු සිතට නොදැනී යටි සිත විසින් ලබා ගන්නා තොරතුරු වේ ද?

මිනිසුන්ට උඩු සිතක් මෙන් ම යටි සිතක් ද ඇති බව පැහැදිලි ය. මනස යනුවෙන් කියැවෙන්නේ කුමක් ද? සිතක් හෙවත් චිත්තයක් හා මනස අතර ඇති සම්බන්ධය කුමක් ද? මේ ආදී සියළු ප්‍රශ්නවලට පැහැදිලි පිළිතුරු අපේ සම්ප්‍රදායෙහි අපට ඇතැයි මම නොසිතමි. එහෙත් අපේ කාර්යය වනුයේ එවැනි ප්‍රශ්නවලට ද පිළිතුරු සැපයීම ය. වියුක්ත ප්‍රවාද යනු අවසාන වශයෙන් ගත්කල වියුක්ත ප්‍රශ්නවලට දෙන වියුක්ත පිළිතුරු වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva